පළාත් අධ්‍යාපන දෙපාර් තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය:- :- ගණිතය

සතිය- 8 (1 වාරය)

සැකසුම :- ඇඹිලිපිටිය අධ්‍යාපන කලාපය

ශ්‍රේණිය:- 8

(ඉගෙනුම් කාලය :- පැය 2 )

## 05. වීජීය ප්‍රකාශන

5.6 වීජීය ප්‍රකාශන දෙකක ඓක්‍යය සුළු කිරීම

- 7 ශ්‍රේණියේදී ඔබ ඉගෙන ගත් වීජීය ප්‍රකාශන පාඩම සිහිපත් කර ගන්න.
- 01. සජාතීය පද,

  02. විජාතීය පද

  යනු කුමක්දැයි උදාහරණ දෙමින් පැහැදිලි කරන්න.
- සජාතීය වීජීය පද එකතු කිරීම හෝ අඩු කිරීම හෝ මගින් එම පද එක් පදයකට සුළු කර ගත හැකිය.
- 62 පිටුවේ නිදසුන් අධ්‍යයනය කරමින් 5.6 අභ්‍යාසය කරන්න.

5.7 වීජීය ප්‍රකාශන දෙකක අන්තරය සුළු කිරීම

$(2a+7)$ න් $(a+6)$ අඩු කරමු.

$$\begin{aligned}(2a+7)-(a+6) &= 2a+7+(-1)\times(a+6)\\ &= 2a+7+(-1)\times a+(-1)\times 6\\ &= 2a+7+(-a)+(-6)\\ &= 2a+7-a-6\\ &= 2a-a+7-6\\ &= a+1\end{aligned}$$

- මෙහිදී අඩු කරන වීජීය ප්‍රකාශනයේ එක් එක් පදය (-1) න් ගුණ කර පළමු ප්‍රකාශනයට එකතු කිරීමෙන් පිළිතුර ලැබේ.

- 63 පිටුවේ නිදසුන් අධ්‍යයනය කර 5.7 අභ්‍යාසය කරන්න.

5.8 අඥාත තුනක් තෙක් අඩංගු වීජීය ප්‍රකාශනයක එක් එක් අඥාතය සඳහා දී ඇති අගයන් ආදේශය

- වීජීය ප්‍රකාශනයක අඥාත පදයන්ට සංඛ්‍යාත්මක අගයන් යෙදීම ආදේශ කිරීම වේ.
- ආදේශ කර සුළු කල විට වීජීය ප්‍රකාශනයට සංඛ්‍යාත්මක අගයක් ලැබේ.

  $p=4,\ q=2$ සහ $r=-3$ වන විට, $2p+q-r+1$ ප්‍රකාශනයේ අගය සොයමු.

$$\begin{aligned}2p+q-r+1 &= 2\times 4+2-(-3)+1\\ &= 8+2+3+1\\ &= 14\end{aligned}$$

- 64,65 පිටු වල නිදසුන් අධ්‍යයනය කර 5.8 අභ්‍යාසය කරන්න.